UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – DECEMBER 2018
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) -2018 දෙසැම්බර්

BUDDHIST CULTURE - I / බෞද්ධ සංස්කෘතිය I - (BCG-1)
(නිර්දිෂ්ට ග්‍රන්ථ)

ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.)
(මෙම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් පශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

1. අග්ගඤ්ඤ සූත්‍රයෙහි ඇතුළත් බෞද්ධ මූලධර්ම පිළිබඳ විමසීමක් කරන්න.

2. සමාජ සංස්ථාවන්හි ප්‍රභවය ප්‍රතීත්‍යසමුත්පන්නව සිදු වූ ආකාරය අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න.

3. බෞද්ධ නිර්වාණගාමී ප්‍රතිපදාවෙහි ලක්ෂණ කූටදන්ත සූත්‍රය අසුරෙන් සාකච්ඡා කරන්න.

4. කකචූපම සූත්‍රයෙහි අතුළත් ධර්මකරුණුවලින් ඉගැන්වෙන මිනිසාගේ සමාජ හා ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳ විමසීමක් කරන්න.

5. කෝපයෙහි ආදීනව හා මෛත්‍රියෙහි ආනිසංස කකචූපම සූත්‍රය අසුරෙන් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

6. සන්දක සූත්‍රයෙහි ඇතුළත් බෞද්ධ භික්ෂුවගේ ආධ්‍යාත්මික හා බාහිර ලක්ෂණ විචාරාත්මකව සාකච්ඡා කරන්න.

7. බෞද්ධ බ්‍රහ්මචර්යාවෙහි සුවිශේෂී ලක්ෂණ සන්දක සූත්‍රාගත ධර්මකරුණු ඇසුරෙන් පැහැදිලි කරන්න.

8. "සුඛාවතිව්‍යූහ සූත්‍රයෙහි අන්තර්ගත බෝධිසත්ව සංකල්පය භක්තිවාදයේ කේන්ද්‍රස්ථානයකි." විමසන්න.

අනෙක් පිටුවට ...

9. “සුඛාවති ලෝකධාතුව පිළිබඳ වර්ණනාව මිනිස් සිත සුඛාවතිය පිළිබඳ දඩි ආශ්වාදයකට පොළඹවයි.” සාකච්ඡා කරන්න.

10. පහත මාතෘකා **හතරක්** සඳහා කෙටි සටහන් ලියන්න.

අ. කකචූපම සූත්‍රාගත උපමා
ආ. සුඛාවතී ලෝකධාතුව
ඇ. යාගය හා දානය
ඈ. ඉවසීම
ඉ. පැවිදි දිවිය

==========

**UNIVERSITY OF PERADENIYA**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - DECEMBER 2018

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - දෙසැම්බර් 2018

BUDDHIST CULTURE -II / බෞද්ධ සංස්කෘතිය II - BCG-2

(බෞද්ධ ආචාර්යවාද)

ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.)

(මෙම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් පශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

1. "මූලික ධර්ම සංගායනා පැවැත්වීමට බලපෑ විවිධ හේතු බුදුන් වහන්සේගේ ජීවමාන අවදියේම පැවතුනි." විචාරයට ලක්කරන්න .

2. "බෞද්ධ ධර්ම සංගායනා මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය වූයේ බුද්ධ සාසනයේ සංශෝධනයක් හා විධිමත් භාවයක් ඇති කරගැනීමයි." සාකච්ඡා කරන්න.

3. අරහත්භාවය පිළිබඳ ථෙරවාදී හා සාර්වාස්තිවාදී මත අතර සම විෂමතා පෙන්වා දෙන්න.

4. සර්වාස්තිවාදයෙහි මූලික ඉගැන්වීම් සාකච්ඡා කරන්න.

5. සෞත්‍රාන්තික දාර්ශනික සම්ප්‍රදායෙහි එන ප්‍රධාන ඉගැන්වීම් පැහැදිලි කොට බාහ්‍යාර්ථ අනුමේයවාදය පිළිබඳ විමසීමක් කරන්න.

6. නාගාර්ජුන හිමියන් පැහැදිලි කරන ශූන්‍යතා දර්ශනය නාස්තික වාදයක් නොව ප්‍රතීත්‍ය සමුත්පාදයම බව සනාථ කරන්න.

7. යෝගාචාර සම්ප්‍රදාය උගන්වන පරිකල්පිත, පරතන්ත්‍ර හා පරිනිෂ්පන්න ස්වභාවයන් පැහැදිලි කොට බුදුන් වහන්සේගේ මූලික දේශනා වලට ඒවායෙහි ඇති සම්බන්ධතාව පෙන්වා දෙන්න.

අනෙක් පිටුවට...

8. "මහායාන සම්ප්‍රදායයන් තුළ බුදුන් වහන්සේ පිළිබඳ ත්‍රිකාය සංකල්පය ක්‍රමයෙන් විකාශය වූවකි." සාකච්ඡා කරන්න.

9. සර්වාස්තිවාද අභිධර්මයෙහි ස්වභාවය හා සංවර්ධනය පිළිබඳ පැහැදිලි කරන්න.

10. පහත සඳහන් බෞද්ධ දර්ශන ඉතිහාසයෙහි එන ආචාර්යවරුන් <u>සතර දෙනෙකු</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. බුද්ධඝෝෂ
II. නාගාර්ජුන
III. වසුබන්ධු
IV. දින්නාග
V. අසංග
VI. ධර්මකීර්ති

==============

**UNIVERSITY OF PERADENIYA**

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – DECEMBER 2018

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) -2018 දෙසැම්බර්**

BUDDHIST CULTURE - III / **බෞද්ධ සංස්කෘතිය 3 - ( BCG - 3)**

**(ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය)**

ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න

(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. (කාලය පැය තුනයි.)

---

1. "ශ්‍රී ලංකාවේ දේශීය ජනයාට ධර්මදේශනා කිරීම සඳහා මිහිඳු හිමියන් තෝරාගත් දේශනා එම යුගයේ ආගමික විශ්වාසවලට යෝග්‍ය විය." විමසන්න.

2. මහා සංඝරත්නය ජාතියේ මුරදේවතාවුන් වහන්සේලායැයි හඳුන්වනු ලබන්නේ කුමන හේතු නිසා ද යන්න ඓතිහාසික සාධක ආශ්‍රයෙන් තාර්කානුකූලව විමසන්න.

3. බෞද්ධ රාජ්‍ය ප්‍රතිපත්ති පදනම් කරගෙන පුරාතන ලංකාවේ යහපාලනයක් තිබූ බව ස්ඵුට කිරීමට ඇති සාධක දක්වන්න.

4. "බුදුසමය අගය කළ මනුෂ්‍යත්වය නඟා සිටුවීම සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ අරමුණ වේ." නිදසුන් සහිතව පරීක්ෂා කරන්න.

5. ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය සමඟ සම්බන්ධව ඇති සාම්ප්‍රදායික විශ්වාස හඳුන්වා දෙන්න.

6. පොළොන්නරු යුගයේ බෞද්ධ සංස්කෘතියේ ඇති වූ නව ප්‍රවණතා පරීක්ෂා කරන්න.

7. ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලා අතර උද්ගත වූ විසඳිය නොහැකි ආරාවුල් විසඳීමට රජය මැදිහත් වූ ආකාරය පිරික්සන්න.

අනෙක් පිටුවට ...

8. පුරාතන ලංකාවේ ප්‍රජා සංවර්ධන කටයුතුවලදී භික්ෂූන්වහන්සේලා යොදාගත් බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරන්න.

9. ශ්‍රී ලංකාවේ බෞද්ධ බිතුසිතුවම් කලාවෙන් නිරූපණය වන සදාචාරාත්මක වටිනාකම් හඳුන්වා දෙන්න.

10. "යටත් විජිත යුගයට පෙර සිංහල ජනයාගේ ජීවන රටාව බෞද්ධ පරමාදර්ශ අනුව හැඩ ගැන්විණි." සාකච්ඡා කරන්න.

==========